# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 42 දරන
# ලංකාවේ සංවර්ධන මූදල් සංස්ථා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 03 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 42 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 60/81

**ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 42 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1958 අංක 8 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනතෙහි 4 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි "සියයට විස්ස" යන වචන වෙනුවට, "සියයට හතළිස් නවය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ. 165 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 12 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (vii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(vii) කළමනාකාර, තාක්ෂණික සහ පරිපාලන උපදේශක සේවා සහ වෙළෙඳ බැංකු සේවා වැනි සේවාවන් සැලසීම සහ ශ්‍රී ලංකාවේ පෞද්ගලික කාර්මික, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යාපාරවලට කළමනාකාර, තාක්ෂණික, පරිපාලන සහ වෙළෙඳ බැංකු සේවා ලබා ගැනීමෙහි ලා සහාය වීම ;".

(2) ඒ වගන්තියේ (xv) සහ (xvi) වන ඡේද, පිළිවෙළින් (xxi) සහ (xxii) වන ඡේද ලෙස නැවත අංක කිරීමෙන්.

(3) ඒ වගන්තියේ (xiv) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xv) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන ඒ ප්‍රමාණවලින් සහ ඒ කාල සීමා සඳහා ණය පත්‍ර නිකුත් කිරීම සහ යම් තැන්පත්කරු වෙතින් ස්ථිර තැන්පතු භාර ගැනීම ;

(xvi) එහි කාර්ය කර ගෙන යාම සඳහා ද එහි බලතල ක්‍රියාවේ යෙදවීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද ඊට සහාය වීම පිණිස පරිපාලිත සමාගම් පිහිටුවීම ;

2—ඒ 65470—13,600 (82/08)

(xvii) අනුමත ණය දෙන ආයතන සමඟ ණය, සාමාන්‍ය කොටස්, ප්‍රතිරක්ෂණ වැඩ පිළිවෙලවල් සහ ඇප වීම් සම්බන්ධයෙන් සහභාගි වීම;

(xviii) බඩු ගබඩා, ගුදම්, බඩු බාගිරාදිය සහ ගොඩනැගිලි, යන්ත්‍ර, උපකරණ සහ වෙනත් භාණ්ඩ බදු දීම, කුලියට දීම, එකවර මුදලට විකිණීම හෝ කුලී සින්නක්කර පදනමක් මත විකිණීම;

(xix) එහි මුළු ණය මුදල හෝ ඉන් කොටසක් හෝ කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යාපාර බවට පත් කිරීම සහ එවැනි යම් ව්‍යවසායක් විසින් නිකුත් කරන ලද බැඳුම්කරවලට හෝ ණය පත්‍රවලට අදාළ එහි ආයත මුදල් සාමාන්‍ය ප්‍රාග්ධන කොටස් බවට පත් කිරීම;

(xx) සංස්ථාව විසින් ඉටු කරනු ලබන කාර්ය සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන ඒ කොමිස් මුදල්, තැරැව්කාර ගාස්තු, පොළිය, පාරිශ්‍රමික හෝ ගාස්තු ලබා ගැනීම.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1967 අංක 1 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

“(1) සංස්ථාවේ අනුදත් කොටස් ප්‍රාග්ධනය එක් එක් කොටස රුපියල් සියය බැගින් වූ සාමාන්‍ය කොටස් තිස් ලක්ෂයකට බෙදනු ලැබූ රුපියල් කෝටි තිහක් වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 12 දරන පනතින් ප්‍රතියෝජනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

“(2) (මෙහි මින් මතු “ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයා” යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් යම් තැනැත්තකු කලින් කල පත් කිරීමට ද, ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කිරීමට ද, ඉල්ලා අස්වීමෙන්, මිය යාමෙන්, ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් එම ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වූ විට, ඒ පුරප්පාඩුව පිරවීම පිණිස අධ්‍යක්ෂවරයකු පත් කිරීමට ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා හිමිකම් ලැබිය යුතු ය. ආණ්ඩුවේ අධ්‍යක්ෂවරයා, මාරුවෙන් මාරුවට විශ්‍රාම නැතීමට හෝ ඒ අමාත්‍යවරයා විසින් හැර, ධුරයෙන් ඉවත් කරනු ලැබීමට හෝ යටත් නොවන අතර, සුදුසුකම් ලැබීමේ කොටස් කිසිවක් දැරීමට ඔහු බැඳී නොසිටින්නේ ය. ඉහත කී කරුණුවලට යටත් ව, සංස්ථාවේ

වෙනත් යම් අධ්‍යක්ෂවරයකු සතු අයිතිවාසිකම් සහ වරප්‍රසාද වලට සමාන අයිතිවාසිකම් හා වරප්‍රසාදවලට ආණ්ඩුවේ අධ්‍යක්ෂ වරයා හිමිකම් ලබන අතර, එසේම සමාන බැඳීම්වලට ද ඔහු යටත් විය යුතු ය.".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ධුරය තත් කාලයෙහි දරනු ලබන්නා, ඡන්දය දීමේ අයිතිවාසිකම රහිතව, නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරයකු විය යුතු ය. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂ වරයා විසින් සුදුසුකම් ලැබීමේ කොටස් කිසිවක් දැරිම අවශ්‍ය නොවන්නේ ය."; තව ද

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි "පුරවැසියන් විය යුතු ය." යන වචන වෙනුවට, "පුරවැසියන් විය යුතු ය. කිසිදු කොටස් හිමි—අධ්‍යක්ෂවරයකු විසින්, අවුරුදු අටකට වැඩි අඛණ්ඩ කාල සීමාවක් සඳහා ධුරය නොදැරිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 13 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) ආණ්ඩුව විසින් සංස්ථාව වෙත (1) වන උපවගන්තිය යටතේ දෙන ලද යම් ණයක් පියවා නොමැති තාක් කල්, සංස්ථාව විසින් එක් එක් වර්ෂයේ දී, ඒ වර්ෂය සඳහා සංස්ථාවේ මුදල් ප්‍රකාශයෙහි දක්වෙන සංස්ථාවේ ශුද්ධ ලාභවලින් සියයට විස්සකට අඩු නොවන මුදලක් විශේෂ සංචිත අරමුදලක වෙන් කොට තැබිය යුතු අතර, එසේ වෙන් කොට තබන ලද මුදල එතෙක් පියවීමට තිබුණ ආණ්ඩුවේ ණය ප්‍රමාණයට සමාන වන තෙක් එසේ වෙන් කොට තැබිය යුතු ය.".

7. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 12 දරන පනතින් ප්‍රති යෝජනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ "හත් කෝටි විසි ලක්ෂයක්" යන වචන වෙනුවට, "කෝටි තුන් සියයක්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.